එකම රන් පදක්කම

(රංජන් පරණවිතාන මෙල්බර්න් සිට.....)

මීට වසර 10 කට පෙර ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාව ලොව ඉහළම හිණි පෙත්තට රැගෙන යමින් ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩකයෝ ලෝක ශූරතාව දිනා ගත්හ. ඊටත් පෙර මොහොමඩ් ලාෆීර් අප රටේ බිලියඩ් හා ස්නූකර් ක්‍රීඩාව මුළු ලොවම අවධානයට ලක් කරවමින් එහි ලෝක ශූරතාව දිනා දුන්නේය. ඩන්කන් වයිට් විසින් 1948 ඔලිම්පික් රිදී පදක්කම දිනා දීමෙන් අනතුරුව ශ්‍රී ලාංකේය මලල ක්‍රීඩාවේ පදක්කම් නියඟයට තිතක් තබමින් සුසන්තිකා ජයසිංහ පසුගිය ඔලිම්පික් ක්‍රීඩා උළෙලේදී ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කමක් දිනා දුන්නාය. පුෂ්පමාලි රාමනායක හා මාලි වික්‍රමසිංහ වෙඩි තැබීමේ ඉසව්වෙන් ශ්‍රී ලංකාවට පොදු රාජ්‍ය මණ්ඩලීය රන් පදක්කමක් දිනා දුන්හ.

මොවුන් විසින් ඒ ඒ ක්‍රීඩා වලින් එසේ දක්වන ලද උපරිම දක්ෂතා අනුව ඔවුන් අනුගමනය කරමින් එයට සමානව හෝ ඊටත් වඩා දස්කම් දැක්විය හැකි ක්‍රීඩකයන් අපට බිහිවනු ඇතැයි බොහෝ දෙනාගේ බලාපොරොත්තුව විය. ඒත් මේ වනවිට අප රටේ ක්‍රිකට් ක්‍රීඩකයන් ලෝක කුසලාන ජයග්‍රහණයේ 10 වසර සමරන්නේ වසර විසි ගණනකට පසු ශ්‍රී ලංකාවේ එක්දින තරගාවලියක සියලුම තරග පරාජය වෙමින් මීළඟ චැම්පියන් කුසලාන අයි.සී.සී. තරගාවලියේ අටවැනි ස්ථානය සඳහා සුදුසුකම් ලැබීමේ වටයකට තරග කිරීම සඳහා තල්ලු වන තරම් පහත් අඩියකට වැටෙමිනි. සුසන්තිකාගේ ජයග්‍රහණයෙන් පසු ඇයටවත් වෙනත් කිසිදු මලල ක්‍රීඩක ක්‍රීඩිකාවකටත් ඇය ලැබූ ජයග්‍රහණය ළඟටවත් යා නොහැකි තත්ත්වයකි. මොහොමඩ් ලාෆීර්ගෙන් පසු බිලියඩ් හා ස්නූකර් ක්‍රීඩාවටත් සිදුව ඇත්තේ මෙයමය. පුෂ්පමාලි සහ මාලිත් තම පොදු රාජ්‍ය මණ්ඩල පදක්කම් මට්ටමකවත් මෙවර නොසිටින අතර ඔවුන්ගෙන් පසු විසිපස් වසරකට වැඩි සිවිල් යුද්ධයක් හා දිනපතා මිනිසුන් ඉලක්ක කොට වෙඩි තබා මරා දමන රටක ඉලක්කයට වෙඩි තැබිය හැකි ජාත්‍යන්තර මට්ටමේ දක්ෂයකුද බිහිවී නොමැත. නොවසේනම් එවැනි සැබෑ දක්ෂයකු මේ දක්වා සොයාගෙන නැත.

මෙවැනි පසුබිමක අප රටේ බර ඉසිලීමේ ඉසව්වෙන් ජාත්‍යන්තරයට යා හැකි දක්ෂයන් සිටින බව මේ දිනවල ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් නුවර පැවැත්වෙන 18 වැනි පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේදී ඔප්පු කිරීමට පොළොන්නරුවෙන් පැමිණි 24 හැවිරිදි ගැමි තරුණයකුට හැකි විය. අනෙකුත් ක්‍රීඩකයන්ට තරගයක් දිය හැකි මට්ටමේ මෙන්ම අගලකටවත් ළඟා විය නොහැකි මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් මෙන්ම හුදෙක් මෙල්බර්න් සවාරියේ පැමිණි නිලධාරීන් ඇතුළු 110 කට ආසන්න ශ්‍රී ලංකා කණ්ඩායමක් මෙවර පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලට පැමිණයද පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල තුළ ශ්‍රී ලංකා ධජය අභිමානයෙන් යුතුව ලෙලවන්නටත් ජාතික ගීය වාදනය කරවන්නටත් හැකි වූයේ කිසිවකු බලාපොරොත්තු නොතැබූවත් තමන්ට තමන් ගැන ආත්ම විශ්වාසයක් තැබූ මේ තරුණයාට පමණි.

> අනුග්‍රාහකයෝ නැහැ කියල මං උත්සාහය අත හැරියෙ නැහැ. මට ඕන කළේ රන් පදක්කමයි
>
> - චින්තන විදානගේ

තමන් මෙවර පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ අනිවාර්යයෙන්ම පදක්කමක් දිනන බව මොහුට දැඩි විශ්වාසයක් තිබිණ. චින්තන විදානගේ නම් මේ ක්‍රීඩකයා තරගය අතරතුරදී ගතේ සවියට වඩා තම සිතේ සවිය බලවත් බව මොනවට ප්‍රදර්ශනය කළේය. කි.ග්‍රෑ. 62 බර පන්තියේ බර ඉසිලීමේ ඉසව්ව ඔහු ජයග්‍රහණය කරමින් රන් පදක්කම දිනා ගත්තේ ශ්‍රී ලංකාවේ ගෞරවය මෙවර තරගාවලිය රැක ගනිමිනි. ඔහු දිනූ එකම පදක්කම සමස්ත පදක්කම් සටහනේ රටවල් 71 ක් අතර 10 වැනි ස්ථානයට ඉහළින් රඳවා තැබීමට සමත් විය. මෙය මෙල්බර්න් නුවර වසන ලක්ෂයකට අධික ශ්‍රී ලංකා වැසියන්ගේද ඉමහත් ආඩම්බරයට හේතුවක් විය. ඒ නිසාම පදක්කම දිනා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකාව තුළ චින්නතට පිළිගැනීමක් හෝ කෘතගුණ සැළකීමක් සිදුවන්නට පෙර මෙල්බර්න් නුවරදීම තම කණ්ඩායමෙත් මෙන්බර්න් ශ්‍රී ලාංකිකයන්ගේත් ගෞරවාදරය ලැබිණ.

මෙන්බර්න් නුවර විවිධ ශ්‍රී ලංකා සංගම් හා සංවිධාන එක්ව චින්තන වෙනුවෙන් පිළිගැනීම් හා උපකාර උත්සව ලහි ලහියේ සංවිධානය කෙරිණි.

පළුගස්දමන සේවා මුක්ත විදුහලේ මූලික අධ්‍යාපනය ලබා 5 වසර ශිෂ්‍යත්වය සමත් වී පොළොන්නරුව රාජකීය විද්‍යාලයට පැමිණි චින්තනට උසස් පෙළ සමත් වුණත් සරසවි වරම් අහිමි වූයේ ලකුණු 3 කිනි. ගුවන් හමුදාවට බැඳුණු ඔහු මේ වනවිට එයින් ඉවත්ව රැකියාවක් විරහිත තරුණයකු ලෙස මෙවර පොදු රාජ්‍ය මණ්ඩලීය තරගාවලිය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත් විය.

කෙසේ වෙතත් බර ඉසිලීමේ ක්‍රීඩාව ශ්‍රී ලංකාව පුරා එක් රැයකින් ජනප්‍රිය කරවන්නට සමත් වූ චින්තන විදානගේ ඉරිදා ලක්ධිම සමඟ මෙල්බර්හිදී පැවැත්වූ විශේෂ සම්මුඛ සාකච්ඡාවක් මෙහි දැක්වේ.

*** ඔබේ මේ ජයග්‍රහණය ඔබ දකින්නේ කොහොමද?**

මං මේ තරගාවලියට ආවෙ පදක්කමක් දිනා ගන්නමයි. ඒත් රන් පදක්කම ගැන බලාපොරොත්තුව ආවෙ මෙහෙ ආවට පස්සෙ. තරගාවලියට දින කිහිපයකට පෙර අපට ලබාදුන් ක්‍රීඩක ශ්‍රේණිගත කිරීම් වල මං ඉදිරියෙන්ම ඉන්න බව කියවුණා. ඒක මට හොඳ ධෛර්යයක් වුණා. පසුගිය මැන්චෙස්ටර් පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙලේ මං සිව්වැනි ස්ථානය දිනා ගත්තා. මීළඟ ක්‍රීඩා උළෙලේදී මට අහිමි වූ පදක්කම කොහොම හරි දිනනවා කියල එහෙදිම හිතා ගත්තා.

*** මේ ක්‍රීඩාවට ඔබ නැඹුරු වුණේ කොහොමද?**

වැඩි කාලයක් නැහැ. මං බර උසුලන්න පටන් ගත්තෙ පොළොන්නරුව බර ඉසිලීමේ ක්‍රීඩා සමාජයේ. ඒ 1997 දී. කුඩා අවදියෙම පියා අහිමි වීම නිසා අපේ පවුලෙ එදිනෙදා කටයුතු කරගෙන ගියේ අම්මාරුවෙන්. ඒත් මගේ මව හැකි අන්දමින් අපට උදව් කළා. ශ්‍රී ලංකා සංචිතයට තේරුණු පසු මහනුවර වයි.එම්.සී.ඒ. එකේ පුහුණුවීම් කරගෙන යන්න අවස්ථාව ලැබුණා. එදා ඉඳලම මගේ පුහුණුකරු වූයේ කුමුදු කුමාර සිල්වා මහතායි. ඔහුත් පොළොන්නරුවේ අයෙක්.

*** ඔබ මේ ක්‍රීඩාව ප්‍රගුණ කළේ කොහොමද?**

මං විශාල කැපකිරීමක් කළා. බර නියමිත පරිදි පවත්වාගෙන යාමට ආහාර පවා සීමා කළා. පුහුණුවීම් නොකඩවාම කරගෙන ආවා. පාකිස්තානයේ විශේෂඥ පුහුණුකරු කයිසර් හයාට් මහතා මට දුන් උපදෙස් ඉතා වැදගත් වුණා. මගේ පුහුණුකරු කුමුදු කුමාර මෙන්ම වික්‍රමසිංහ හා විජේවික්‍රම යන මහත්වරුන් ලබාදුන් උපදෙස් මා අගය කරනවා. ඔවුන්ට මා ස්තූතිවන්ත විය යුතුයි. ඔවුන් මගේ මානසිකත්වය හැමවිටම ඉහළ දැම්මා. මේ ක්‍රීඩාවේදී මානසිකත්වය හොඳින් පවත්වාගෙන යාමත් ඉතා වැදගත්.

*** මේ අතර කාලයේදී ඔබට අනුග්‍රාහකයන් ලැබුණේ නැද්ද?**

නැහැ. මට අනුග්‍රාහකයො හිටියෙ නැහැ. මේ ක්‍රීඩාවෙම සමහරුන්ට අනුග්‍රාහකයො ලැබෙද්දී මට ලැබුණේ නැහැ. ඒත් මං කාටවත් දොස් කියන්නෙ නැහැ. මං ඒකෙන් අධෛර්යට පත් වුණෙත් නැහැ. මගේ උත්සාහය අත් හැරියෙත් නැහැ. පුහුණු සංචිතයෙන් ලැබුණු දීමනාව විතරයි ලැබුණෙ. මට අවශ්‍ය වෙලා තිබුණේ මුදල් නෙවෙයි. රන් පදක්කමක්.

*** නැවත වරක් ඔබ රන් පදක්කම දිනූ අවස්ථාව මතක් කළොත්?**

මං තරගයේ මුල ඉඳලම ඉලක්ක කළේ ඕස්ට්‍රේලියන් ක්‍රීඩකයාවයි. ඉන්දීය ක්‍රීඩකයාවයි. ඕස්ට්‍රේලියානු ක්‍රීකයා තමයි පහුගිය මැන්චෙස්ටර් තරගාවලියේ රන් පදක්කම දිනුවේ. ඉන්දීය ක්‍රීඩකයා වැඩිය ප්‍රසිද්ධ නොවුණත් ඔහු වැඩි බර ප්‍රමාණයක් උස්සන ක්‍රීඩකයෙක් බව මං දැනගෙන හිටියා. ලංකාවෙදි අපේ පුහුණු උපකරණ වලට වඩා මෙහේ උපකරණ වෙනස්. මගේ අත් හම ගිහිල්ලා තිබුණා. ඒත් මං උත්සාහය අත හැරියෙ නැහැ. අන්තිම උත්සාහයෙදි මට කි.ග්‍රෑ. 153 ක් උස්සන්න තිබුණා. මං ඊට වඩා බර උස්සල තිබුණ නිසා මට ඒක අභියෝගයක් වුණෙ නැහැ. මං අන්තිම එසවීමට එද්දී කවුදෝ සිංහලෙන් කෑගහල මාව දිරිගැන්වුවා. කොහොම වුණත් ඒ වෙලාවෙ මට රන් පදක්කම හැර වෙනත් දෙයක් ඔළුවට ආවෙ නැහැ.

*** ඔබේ මේ ජයග්‍රහණයෙන් පස්සෙ බර ඉසිලීමේ ක්‍රීඩාවට ශ්‍රී ලංකාව තුළ කුමන පිළිගැනීමක් ලැබේවිද?**

මා බලාපොරොත්තු වුණු එක දෙයක් තමයි ඒ. අපේ රටේ ක්‍රිකට්, මලල ක්‍රීඩාවලට තැනක් තියෙන්නෙ, ඒ ක්‍රීඩා ජාත්‍යන්තර මට්ටමට ගිය නිසයි. බර ඉසිලීමත් ඉස්සෙල්ල එතනට යන්න ඕන වෙලා තිබුණා. මේ පදක්කම නිසා බර ඉසිලීමටත් යම් පිළිගැනීමක් ලැබේයි. එහෙම වුණොත් මට ඒක ලොකු සතුටක්.

*** අවසන් වශයෙන් ඔබගේ අනාගත බලාපොරොත්තුව ගැන කීවොත්?**

මගේ බලාපොරොත්තුව ක්‍රීඩාව තවත් ඉදිරියට ගෙන යාමයි. ඔලිම්පික් පදක්කමක් දිනා ගැනීම මීළඟ බලාපොරොත්තුවයි. ඒ වගේම අතරමඟ කඩා වැටුණු මගේ අධ්‍යාපන කටයුතු දිගටම ගෙන යාමත් තව බලාපොරොත්තුවක්. අපේ රටේ ජනතාව මා සමඟ ඉදිමත් ඔවුන්ගෙන් ලබන ආශිර්වාදයත් මට විශාල පිටුවහලක් වේවි..